

# සඳලීගේ උපන් දිනය

එන්.ජී. ඉසුමි සෙහන්සා ඉලංගකෝන්

# සඳලිගේ උපන් දිනය

එන්.ජී. ඉසුමි සෙහන්සා ඉලංගකෝන්

**"සඳලිගේ උපන් දිනය"**

කර්තෘ ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය 2023 ඔක්තෝබර්

කතාව සහ චිත්‍ර

**එන්.ජී. ඉසුමි සෙහන්සා ඉලංගකෝන්**

5 ශ්‍රේණිය D

මහාමායා බාලිකා විදුහල

ISBN 978-624-206-726-1

# <u>පිදුම</u>

මෙතෙක් මා හට සිප්සතර කියා දුන්

ගුරු මෑණිවරුන්ට හා

මා ආදරයෙන් හදා වඩා ගන්නා

මාගේ දෙමාපියන්ට

මෙම පොත ආදරයෙන්

පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකූර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම් මහතාගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර,
විදුහල්පතිනිය.
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.
2023 .10 . 20


අම්මා කෙනෙකුටයි තාත්තා කෙනෙකුටයි පුංචි දුවලා දෙන්නෙක් හිටියා. ලොකු දුවගේ නම සඳලි ය. පොඩි දුවගේ නම නෙසාකි ය. ලොකු දුවගේ දහවෙනි උපන් දිනය ළඟ එන නිසා එයාට හරි සතුටුයි.

"අම්මේ මේසැරේ මගේ උපන් දිනයට අපි කොහේද යන්නේ?" සඳලි දුව අම්මාගෙන් ඇසුවා.



“අපි මෙදා සැරේ දුවගේ උපන් දිනය හොඳ තැනක සමරමු” අම්මා කිවුවා.

“ඒ කොහේද අම්මේ?” සඳලි දුව අම්මා වැළඳ ගෙන සිනාමුසු මුහුණින් ඇසුවා. නංගිත් අම්මාගේ අතේ එල්ලී කොහේද අම්මේ කියා ඇසුවා.




“අපි මෙදා සැරේ තාත්තායි මමයි කතා කරගෙන ඉන්නේ , පන්සලට දානය උදෙන්ම හදාගෙන පූජා කරලා වැඩිහිටි නිවාසයකට කෑම බීම හදාගෙන දුවගේ උපන් දින කේක් එක එහි දී කපන්න” අම්මා කිවුවා.

“මොකක්ද අම්මේ වැඩිහිටි නිවාසයක් කියන්නේ?”සඳලි අම්මාගෙන් ඇසුවා.
“වැඩිහිටි නිවාසයක් කියන්නේ , කවුරුත් උදවු කරන්නේ නැති කවුරුත් නැති නැන්දලා, මාමලා, ආච්චිලා, සීයලා ඉන්න තැනක්”. අම්මා කිවුවා.
“ඔව් දුවලගේ ආච්චිලත්, සීයලත් ජීවතුන් අතර නැති නිසා අපි දුවගේ උපන් දිනයට එයාලට සලකන්න ලැබෙන එක හොඳයි කියලා හිතුණා”. සඳලිගේ තාත්තාත් කිවුවා.

සඳලිගේ උපන් දිනය ළඟටම ආවා. “හෙට නේද අම්මේ මගේ උපන්දිනය?” සඳලි අම්මාගෙන් ඇසුවා.

“ඔව්, අපි හෙට උදෙන්ම නැගිටින්න ඕනේ නිසා පන්සිල් අරගෙන ඉක්මණින් නිදා ගමු“. අම්මා කිවුවා.

පසුදා උදෙන්ම තාත්තා, අම්මා, නංගී සඳලිට ‘සුභ උපන් දිනයක් වේවා!’ කියා සුභ පැතුවා. ඉන්පසු අම්මා සහ තාත්තා කතාකර ගත් විදිහට පන්සලට ගොස් දානය පූජා කර වැඩිහිටි නිවාසයට කෑම සාදා ගෙන සියලු දෙනා සමග ගියා.



ඒගොල්ලෝ වැඩිහිටි නිවාසයට ඇතුළු වෙද්දී වැඩිහිටි නිවාසයේ සිටින නැන්දලා, මාමලා, ආච්චිලා , සීයලාගේ මුහුණේ තිබුණේ අහිංසක සිනාවක්. ඉන්පසු සඳලිගේ පවුලේ අයගේ හා වැඩිහිටි නිවාසයේ සියලු දෙනාගේ අත්පුඩි මැද කේක් එක සතුටින් කැපුවා.

සඳලි තමන්ගේ තාත්තා , අම්මා , නංගිටත් වාගේම වැඩිහිටි නිවාසයේ සිටින හැමෝටම තමන්ගේ මාමා, නැන්දා, සීයා, ආච්චි කියා සිතා කේක් කැවුවා.



දවල් කෑමටත් සඳලිගේ පවුලේ අය බත් සදාගෙන ගියා. වැඩිහිටි නිවාසයේ සියලු දෙනාට කෑම බෙදා ළඟට ගිහින් දුන්නා.
සඳලිගේ නංගී පොඩි වුනත් හරි ආසාවෙන් කෑම බෙදා එයාලගේ ළඟට ගිහින් දුන්නා. මේ අය අතරේ හිටියා අතපය වාරු නැති ආච්චි කෙනෙක්."මේ ආච්චි කොහොමද කෑම කන්නේ?" සඳලි අම්මාගෙන් ඇසුවා." මම ආච්චිට බත් කවන්නම්"අම්මා කිවුවා. සඳලිගේ අම්මා ඉතාමත් සතුටින් කාරුණිකව ආච්චිට බත් කවා වතුර ද දුන්නා.





"පව් නේද තාත්තේ අර බලන්න අම්මා බත් කවද්දී ආච්චිගේ ඇස්වල කඳුළු තිබුණා. ඇයි තාත්තේ ඒ?" සඳලිගේ නංගී තාත්තාගෙන් ඇසුවා. සඳලි ද නංගී ළඟ සිට "මමත් හැම වෙලාවෙම දැක්කා , එයාලා කොච්චර හිනා වුණත් ඇස්වල මොකක්ද දුකක් තියෙනවා. ඇයි තාත්තේ ඒ ? අපෙන් වරදක්වත් වුණාද?" සඳලි තාත්තාගෙන් ඇසුවා.

නෑ දුවේ එයාලාට එයාලාගේ දරුවෝ මුණුපුරෝ මතක් වෙනවා ඇති. මෙතන ඉන්න සමහර වැඩිහිටියන්ගේ දරුවෝ හොඳ වත්පොහොසත්කමින් කල් ගෙවනවා ඇති. ඒ දරුවන්ට මේ දෙමව්පියෝ පොඩි කාලේ සිට හදාවඩා හොඳින් උගන්වන්න මහන්සි වෙන්න ඇති. එහෙම කරපු දෙමාපියන් බැරිවුනු කාලෙක තනි කෙරුවාම කොහොමද පුතේ හිතට වාවන්නේ.



ඒකයි එයාලාගේ ඇස්වලින් මතු වෙන්නේ.
අපි කොච්චර උගත් වුනත් මුදල් තිබුණත්
දෙමාපියන්ව බැරි කාලේ අපි එයාලාට සැලකුවේ
නැත්නම් මේ කිසිම දේකින් වැඩක් නෑ. දුවේ.
නැති බැරිකම් තිබුණත් තියෙන විදියට
දෙමාපියන් බලාගන්න ඕනේ. බැරි කාලේ තනි
කරන්න හොඳ නෑ.” සඳලිගේ තාත්තා ඉතාමත්
දුකෙන් වගේ දියණියන් දෙදෙනාගේ හිස අතගා
කීවා.



“ඔව් දුවේ දරුවෝ දෙමාපියන් අතහැරියාට දෙමාපියන් කවදාවත් දරුවන්ව අතහරින්නේ නෑ. එයාලා ජීවත්වෙලා ඉන්න තුරාවට දරුවෝ හිත ඇතුලේ ඉන්නවා” කියා අම්මා ද දුකෙන් සඳලිට කීවා.

“අනේ තාත්තේ අම්මේ අපි අපිට පුළුවන් හැම වෙලාවෙම අපි මෙයාලව බලන්න එමු නේද. අපිට පුළුවන් විදියට කෑමත් හදාගෙන එමු” කියා සඳලිත් නංගිත් කීවා.

“ඔව් ඒක හොඳයි” කියා සඳලිගේ පවුලේ සියලු දෙනා එතනින් පිටත් වුණා.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20